# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

## 47 - ඉස්ලාම් ශිෂ්ටාචාරය (පැරණි නිර්දේශය)

## ලකුණු බෙදීයාම

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | 02 X 50 | = | 100 |
| II පත්‍රය | 02 X 50 | = | 100 |
| එකතුව | | = | 200 |

Department of Examinations

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග ☐ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**




Department of Examinations

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.
3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.
4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

Department of Examinations

***

0027

AL/2020/47-S-I(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | | |
|---|---|---|
| ඉස්ලාම් ශිෂ්ටාචාරය I<br>இஸ்லாமிய நாகரிகம் I<br>Islamic Civilization I | 47 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

Department of Examinations

**1.** ජාහිලියියා සමයේ කඃබාවෙහි පරිපාලනය කෙසේ හැඳින්වූයේ ද?
(1) සිකායා (2) රිෆාදා (3) හිජාබා (4) රිබාදා (5) නත්වා

**2.** අබූ උස්මාන් නායකත්වයෙන් යුත් වෙළෙඳ දූත කණ්ඩායමක් ඊජිප්තුවට පිටත්කරන ලද්දේ ශ්‍රී ලංකාවේ කුමන රාජ්‍ය සමයේ ද?
(1) ගම්පොළ (2) යාපහුව (3) අනුරාධපුර
(4) පොළොන්නරුව (5) මහනුවර

**3.** ඉස්ලාම් මිනිසා මත පටවා ඇති වගකීම් පෙන්වන කාණ්ඩය,
(1) ඉබාදත්, ඉමාරත්, කිලාෆත් වේ. (2) තෞහීද්, රිසාලත්, මආද් වේ.
(3) රිසාලත්, ඉස්මත්, වකාලත් වේ. (4) ඉබාදත්, හික්මත්, නුස්රත් වේ.
(5) ඉමාරත්, ඉදාරත්, සිකායත් වේ.

**4.** ඉමාම් අහ්මද් ඉබ්නු හම්බල් (රහ්) තුමාගේ ප්‍රසිද්ධ වූ ෆික්හු ග්‍රන්ථය කුමක් ද?
(1) මසාඉල් සාලිහ් (2) කිතාබුර් රිසාලා (3) මුකද්දිමා
(4) ෆුතුහුල් ගෛබ් (5) ෆික්හුල් කබීර්

**5.** ශ්‍රී ලංකාවේ වැලිගම පිහිටි 'මද්රසතුල් බාරි' හි නිර්මාතෘ කවුද?
(1) මුබාරක් මව්ලානා (2) ෂෙයිහ් මුස්තෆා වලියුල්ලා
(3) මාප්පිලෙයි ලෙබ්බෙ ආලිම් (4) අල්-බාදිබ් අල්-යමානි
(5) කසාවත්තේ ආලිම් සාහිබ්

**6.** හුදෛබියා සම්මුතියේ සටහන් වූ අවස්ථාවේ මක්කා සිට මදීනාවට පැමිණි සහාබිවරයෙක් කුරෛෂ්වරුන් විසින් නැවතත් මක්කාවට කැටුව ගියේ ය. එම සහාබිවරයා වන්නේ,
(1) අබ්දුර් රහ්මාන් බින් අව්ෆ් (රලි) වේ. (2) අබූ සර්ද් අල් කුද්රි (රලි) වේ.
(3) අබූ ජන්දල් (රලි) වේ. (4) සඃද් බින් අබී වක්කාස් (රලි) වේ.
(5) මආද් බින් ජබල් (රලි) වේ.

**7.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඉමාම් මාලික් (රහ්) තුමා තෆ්සීර් දේශකයන් අතුරින් කෙනෙකි.
(2) දීනේ ඉලාහි යන චින්තනය බාබර් මෝගල් රජු ඉදිරිපත් කර ඇත.
(3) වෛද්‍ය විද්‍යාඥ ඉබ්නු නෆීස් රුධිර සංසරණය පිළිබඳ අදහස් ප්‍රකාශ කර ඇත.
(4) අකබා සම්මුතිය නබිතුමා සහ මක්කා වැසියන් අතර සිදු වූවකි.
(5) ඉස්ලාම් ශිෂ්ටාචාරය අරාබි සංස්කෘතිය පදනම් වූවකි.

[දෙවැනි පිටුව බලන්න.

**8.** බෛතුල් මාල් යන මූල්‍ය ආයතනය ස්ථාපිත කිරීමට කලීෆා උමර් (රළි) තුමාට උපදෙස් දුන් පුද්ගලයා වන්නේ,
(1) උස්මාන් බින් හුනෛෆ් (රළි) වේ. (2) හුදෛබතුල් යමානි (රළි) වේ.
(3) මුහම්මද් බින් මස්ලමා (රළි) වේ. (4) මුආද් බින් ජබල් (රළි) වේ.
(5) වලීද් බින් හිෂාම් (රළි) වේ.

**9.** ජමාඅත්තුත් තබ්ලිඃ හා සම්බන්ධ වූ වචන කාණ්ඩ ඇතුළත් වරණය කුමක් ද?
(1) කාර්කුන්, මුරීද්, මුරාකබා (2) මුහාසබා, මුර්ෂිද්, මුකල්ලිද්
(3) කාර්කුන්, ගස්තු, මහල්ලා (4) උස්රා, අව්රාත්, මුනාජාත්
(5) ජම්ඉයියා, නාසිම්, මුරාකබා

**10.** සාහිබුස්සිර් යනුවෙන් හැඳින් වූ නබිතුමාගේ මිතුරා කවුද?
(1) අලි (රළි) (2) හුදෛබතුල් යමානි (රළි) (3) මුආවියා (රළි)
(4) හසන් (රළි) (5) අබූ මූසා අල්-අෂ්අරි (රළි)

**11.** පහත සඳහන් අය අතුරින් අල්-කුර්ආනයට අර්ථ දැක්වීම් රචනා කළ දෙදෙනෙකු දැක්වෙන කාණ්ඩය තෝරන්න.
(1) ෆඛ්රුද්දීන් අර්රාසි (රහ්), ෆුළෛල් බින් ඉයාල් (රහ්)
(2) ඉමාම් ෂාහ් වලියුල්ලාහ් (රහ්), ඉමාම් අබ්දුල් වහාබ් (රහ්)
(3) මව්ලානා ඉල්යාස් (රහ්), මව්ලානා මව්දූදි (රහ්)
(4) ඉමාම් ඉබ්නු තයිමියා (රහ්), ඉමාම් බුහාරි (රහ්)
(5) ඉමාම් ඉබ්නු කසීර් (රහ්), සහීද් සෙයියද් කුතුබ් (රහ්)

**12.** ශ්‍රී ලංකාවේ වෙරළාසන්නයේ මුලින්ම පිහිට වූ මුස්ලිම් ජනාවාස නිවැරදිව දැක්වෙන කාණ්ඩය,
(1) ත්‍රිකුණාමලය, හම්බන්තොට, පුත්තලම, මන්නාරම වේ.
(2) කොළඹ, බේරුවල, හම්බන්තොට, පොතුවිල් වේ.
(3) යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව, කල්පිටිය වේ.
(4) මන්නාරම, බේරුවල, කොළඹ, පුත්තලම වේ.
(5) බේරුවල, මඩකලපුව, කල්පිටිය, පොතුවිල් වේ.

**13.** පවුල් ජීවිතය පිළිබඳව ඉස්ලාමීහි සඳහන්වන නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) විවාහ නොවී පුරුෂ හා ස්ත්‍රීන් එක්ව ජීවත්වීමට ඉඩ ඇත.
(2) විවාහය එක් චාරිත්‍රයක් විනා ඉබාදත් නොවේ.
(3) පිරිමියෙකුට ඕනෑම ස්ත්‍රියක් සමග විවාහ විය හැකි ය.
(4) පිරිමි හා ගැහැනු දෙපාර්ශවයටම විවාහයකට ඇතුළත් වීම ප්‍රතික්ෂේප කළ නොහැකි ක්‍රියාවකි.
(5) විවාහය ගිවිසුමක් පමණක් නොව ඉබාදතයක් ද වේ.

**14.** ඉස්ලාම් ඉතිහාසයේ යත්රිබ් සහ මිස්ර් යන නම්වලින් හැඳින්වෙන ප්‍රදේශ දෙක පිළිවෙළින්,
(1) ඉතියෝපියාව හා අර්මේනියාව ය. (2) මදීනාව හා ඊජිප්තුව ය.
(3) සවුදි අරාබියාව හා මදීනාව ය. (4) ඉරානය හා ඊජිප්තුව ය.
(5) මදීනාව හා ඉන්දියාව ය.

**15.** ප්‍රධාන තරීකාවන් දෙකක් වන කාදිරියියා සහ ෂාදුලියා තරීකාහි නිර්මාතෘවරුන් පිළිවෙළින්,
(1) ඉමාම් අබ්දුල් කාදිර් (රහ්) හා ඉමාම් බහාඋද්දීන් (රහ්) ය.
(2) ඉමාම් නූරුද්දීන් අහ්මද් (රහ්) හා ඉමාම් අබූ ඉස්හාක් (රහ්) ය.
(3) ඉමාම් අබ්දුල් කාදිර් (රහ්) හා ඉමාම් නූරුද්දීන් අහමද් (රහ්) ය.
(4) ඉමාම් බහාඋද්දීන් (රහ්) හා ඉමාම් අබ්දුල් කාදිර් (රහ්) ය.
(5) ඉමාම් නූරුද්දීන් අහමද් (රහ්) හා ඉමාම් අබ්දුල් කාදිර් (රහ්) ය.

**16.** පහත ප්‍රකාශ අතුරින් ඉස්ලාම් ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණයක් ඇතුළත් ප්‍රකාශය තෝරන්න.
(1) මෙලොව ජයග්‍රහණය ඉලක්ක කොටගෙන තිබීම.
(2) මුස්ලිම්වරු බහුතරය ලෙස ජීවත්වන ස්ථානවලට පමණක් ගැලපෙන පරිදි සැකසී තිබීම.
(3) තාර්කික සංකල්පයක් මත රැඳී සිටීම.
(4) මෙලොව, පරලොව ජයග්‍රහනය අරමුණ වී තිබීම.
(5) නම්‍යශීලී නොවන, දෘඩ වූ ක්‍රියාවන්ගෙන් යුක්ත වීම.

Department of Examinations

[ තුන්වැනි පිටුව බලන්න.

**17.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් අබූ මූසා අල් අෂ්අරි (රලි) තුමාව නිවැරදිව හඳුන්වන ප්‍රකාශය කුමක් ද?
(1) දූමතුල් ජන්දල් සාම සාකච්ඡාවල දී අලි (රලි) ගේ නියෝජිතයෙකු ලෙස කටයුතු කළ කෙනෙකි.
(2) හුදෛබියා සම්මුතිය සිදුවන විට නබිතුමාගේ ලේඛකයා ලෙස කටයුතු කළ අයයි.
(3) අකබා සම්මුතිය සිදුවන විට මදීනා වැසියන්ගේ නායකයා ය.
(4) ඊජිප්තුව ජයග්‍රහණය කොට ඉස්ලාම් අධිරාජ්‍යයට එය ඒකාබද්ධ කළ අයයි.
(5) කන්දක් යුද්ධයේ දී නබිතුමා සමග නිපුනතා උපදෙස් හුවමාරු කළ අයයි.

**18.** හර්බුල් ෆුජ්ජාර් යන අරගලය අරාබියේ කුමන ගෝත්‍රිකයන් අතර සිදු වූයේ ද?
(1) අව්ස් - හස්රජ්    (2) කිනානා - කයිස්
(3) බනූ බක්ර් - බනූ නද්ර්    (4) බනූ අතී - බනූ තෛම්
(5) බනූ බකර් - බනූ තක්ලබ්

**19.** ක්‍රි.ව. 1258 හි බැග්ඩෑඩ් බිඳවැටීමට හේතු වූ කණ්ඩායම
(1) කුරුස යුධ වීරයින් වේ.    (2) ස්පාඤ්ඤයින් වේ.    (3) බර්මකීවරු වේ.
(4) සබවිවරු වේ.    (5) තාත්තාරීවරු වේ.

**20.** ක්‍රි.ව. 17 වන සියවසේ භාවිතයේ පැවති, යූනානි වෛද්‍ය සිසුන් විසින් වර්තමානයේ දී ද භාවිතා කරනු ලබන ග්‍රන්ථය,
(1) අල්-හාවි වේ.    (2) අල් කානූන් වේ.
(3) අල්-තෆ්සීර් වේ.    (4) අත්-තස්රීෆ් වේ.
(5) කිතාබුත් තෛසීර් වේ.

**21.** පහත ප්‍රකාශ සලකන්න.
A - ඉස්ලාම් ඉබාදත්වලට පමණක් සීමාකොට තිබීමත් ඉස්ලාම් ශිෂ්ඨාචාරය වර්ධන නොවී පැවතීමට හේතුවක් ලෙස පැවතී ය.
B - දීන් ආරක්ෂා කිරීම, පරම්පරාව රැක ගැනීම, ධනය ආරක්ෂාකර ගැනීම යන්නද හාජියියා යන පදයේ ඇතුළත් වේ.
C - මදීනාවෙහි නබිතුමාගේ සමයේ මුස්ලිම්වරු යුදෙව්වන්, මුෂ්රික්වරු ආදි සියලුදෙනා ගනුදෙනුවල නිරත වූහ.
D - අල් අමීන්, අල්-සාදික් යන අන්වර්ථ නම් නබිතුමාට ලැබුණේ නුබුව්වත් වලින් පසුව ය.
ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) A B    (2) A C    (3) B C    (4) B D    (5) C D

**22.** පහත දැක්වෙනුයේ අකීදා පදනම්ව සැකසුනු චින්තන කණ්ඩායම්වල අදහස් කීපයකි.
A - මහා පාපයන් කල අයව අල්ලාහ්ට අභිමත නම් කමාකරයි නැත්නම් දඬුවම් කරයි.
B - අල්ලාහ් නිදසුන් දැක්වීම හා සැසඳීමටත් ඔබ්බට ගිය කෙනෙකි.
C - අල්ලාහ්ගේ දාත්, සිෆාත් වෙන් වූ ඒවා ය.
D - ඉමාම්වරු වැරදි කිරීමෙන් ආරක්ෂා වී ඇත.
E - නිශ්චිත දිනයේ ලෝක අවසානය සිදුවේ. එවිට මිනිසුන් කබුර්වල සිට නැගිටුවනු ලැබේ.
ඉහත ප්‍රකාශවලින් අෂ්-අරියියාවරුන්ගේ මතයන් පෙන්වන කාණ්ඩය කුමක් ද?
(1) A C E    (2) A B D    (3) B C D    (4) B D E    (5) C D E

**23.** ඉමාම්වරුන් වන මුස්ලිම් (රහ්), අබූදාවුද් (රහ්) යන අයගේ උපන් ස්ථාන පෙන්වන කාණ්ඩය තෝරන්න.
(1) බුහාරා, සමර්කන්ඩ්    (2) නෛසාබූර්, සිජිස්ථාන්
(3) නෛසාබූර්, බුහාරා    (4) කස්වින්, සමර්කන්ද්
(5) කුරාසාන්, සිජිස්ථාන්

**24.** මක්කාහි පිළිම වන්දනාව හඳුන්වා දුන් පුද්ගලයාගේ නම කුමක් ද?
(1) අම්ර් බින් හල්රම්    (2) උබෛයි බින් සලූල්
(3) උමයියා බින් හල්ෆ්    (4) අබූ ජහ්ල්
(5) අම්ර් බින් ලුහෙ

**25.** මදීනා ශාසනයේ කොන්දේසි අතුරින් එකක් වනුයේ,
(1) අහ්ලුල් බෛත්වරුන් ව ආරක්ෂා කිරීම ය.    (2) වසර දහයකට යුධ විරාමයක් ගැනීම ය.
(3) මදීනාවෙන් පිටව නොයාමය වේ.    (4) මහා පාපයන් සිදු නොකර සිටීම ය.
(5) සියලුදෙනා එක්ව අභියෝගයන්ට මුහුණ දීම.

[ හතරවැනි පිටුව බලන්න.



Department of Examinations

**26.** කිලාෆත්හි සාමයට බාධාවක් ඇති කරන ලද බවට කරුණු දක්වා කලීෆා උස්මාන් (රලි) තුමා විසින් රටින් පිටුවහල් කළ සහාබිවරයාගේ නම හා පිටුවහල් කළ ස්ථානය පිළිවෙළින්,

(1) සඃද් ඉබ්නු උබාදා (රලි) - නහර්වාන් වේ.
(2) අබූ දර් අල් කිෆාරි (රලි) - රබාතා වේ.
(3) ජව්ෆර් බින් අබිතාලිබ් (රලි) - හබෂා වේ.
(4) අම්මාර් බින් යාසිර් (රලි) - කූෆා වේ.
(5) මුආවියා බින් අබි සුෆියාන් (රලි) - ෂාම් වේ.

**27.** ඉස්ලාම් ශිෂ්ඨාචාරය බිහිවීමට පදනම් වූ මූලික අංශ පමණක් නිරූපණය වන කාණ්ඩය කුමක් ද?

(1) රිසාලත් - සීරා - ඉමාමත් (2) ඉබාදත් - කිලාෆත් - ඉමාරත්
(3) තෞහීද් - රිසාලත් - මආද් (4) ඉස්මත් - තක්කියත් - විලායත්
(5) තෞහීද් - සීරා - ඉමාරත්

**28.** අහ්ලුත් තෞහීද් වල් අද්ල් යන්නෙන් හඳුන්වන්නේ කවුද?

(1) මුඃතසිලාවරු (2) ඒකදේව වාදින් (3) අද්වෛවාදින්
(4) නබිතුමාගේ පවුලේ සාමාජිකයින් (5) මද්හබ් අනුගමනය කරන්නන්

**29.** මුස්තෆා කමාල් විසින් පාලනයෙන් නෙරපා හරින ලද අවසාන උස්මානීය සුල්තාන් වන්නේ,

(1) සුල්තාන් මුරාද් ය. (2) සුල්තාන් සලාහුදීන් ය.
(3) සුල්තාන් සලීම් ය. (4) සුල්තාන් අබ්දුල් හමීද් ය.
(5) සුල්තාන් මුහම්මදු අල්-ෆාතිහ් ය.

**30.** ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සහිරා විද්‍යාල ශාඛා බිහිකිරීමට මුල් වූ ප්‍රභූවරයා කවුද?

(1) ආචාර්ය T.B. ජායා (2) ආචාර්ය බදියුදීන් මහ්මුද්
(3) ආචාර්ය A.M.A. අසීස් (4) දොස්තර M.C.M. කලීල්
(5) සර් රාසික් ෆරීද්

**31.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A - තෆ්සීර් යන පදය මෙන්ම තඃවීල් යන පදයත් අල්-කුර්ආන් විවරණය හා සම්බන්ධ වේ.
B - දේශ ගවේෂක කොලම්බස්ට ඉන්දියාවට පැමිණීමට මගපෙන්වන්නා ලෙස සිටියේ ඉබ්නු මාජිද් වේ.
C - නබිතුමාගේ සමයේ තෆ්සීර් කලාව තනි ක්ෂේත්‍රයක් ලෙස බිහි වී තිබුණි.
D - හිජ්රතයෙන් පසු නබිතුමා මුහාජිර්වරු හා අන්සාරිවරු අතර සහෝදරත්ව හැඟීම ඇති කළේ ය.

(1) A B (2) A D (3) B C (4) B D (5) C D

**32.** පහත සඳහන් **X** තීරුවට අනුව **Y** තීරුවේ සඳහන් වචන අනුපිළිවෙළට පෙළගැස් වූ විට ලැබෙන නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

| X | Y |
|---|---|
| 1. අල්-හාවි | A - අලි බින් සීනා |
| 2. තාරික් තමත්දුන් | B - ඉබ්නු අබ්දිරබ්බිහි |
| 3. ඉක්දුල් ෆරීද් | C - යූර්ජ් සෛදාන් |
| 4. අල්-කානූන් | D - අල්-රාසි |
| 5. කිතාබුල් මාලික් | E - සකරියියා අර්-රාසි |

(1) A B E D C (2) A C B E D (3) C B E A D (4) E B A D C (5) E C B A D

**33.** පහත වගුවේ **X** තීරුවේ ග්‍රන්ථවල නම් සහ **Y** තීරුවේ ඒවායේ කතෘවරුන්ගේ නම් සඳහන් වේ.

| X | Y |
|---|---|
| 1. කිතාබුල් මකාසි | A - ඉබ්නු සඃද් |
| 2. අල්-කාමිල් | B - ඉබ්නු කල්දූන් |
| 3. අත්-තබකාත් | C - ඉස්හාක් බින් යසාර් |
| 4. අල්-මුකද්දිමා | D - අල්-බලාදූරි |
| 5. ෆුතූහුල් බුල්දාන් | E - ඉබ්නුල් අසීර් |

ඉහත **X** තීරුවේ ඇති ග්‍රන්ථවලට අදාළ **Y** තීරුවේ කතෘවරුන්ගේ නම් නිවැරදිව පෙළගැස් වූ විට ලැබෙන නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

(1) A E B C D (2) A B E D C (3) B A D E C (4) C D B A E (5) D C B A E

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations

**34.** පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A - "අල්ලස් ගන්නන් හටත් අල්ලස් දෙන්නන් හටත් අල්ලාහ්ගේ ශාපය ඇත" යන්න ඉමාම්වරුන්ගේ ප්‍රකාශයකි.

B - "ඇතැම් අයගේ දැත්වල සම්පත් නොරැඳිය යුතු ය. ඒවා ජනයා අතර සංසරණය වන්නක් ලෙස තිබිය යුතුය" යන්න ඉස්ලාම් මතය වේ.

C - මදීනා ශාසනය මගින් නබිතුමාගේ නායකත්වය පිළිගැනීමට හේතු වූ අතර මදීනාහි ජීවත් වූ සියලු ජනයාගේ අයිතීන් තහවුරු කරන ලදී.

D - 'ළමයින් මරන්නේ නැත' යන කොන්දේසිය හුදෛබියා සම්මුතියේ එකතුකොට තිබුණි.

(1) A B (2) A C (3) B C (4) B D (5) C D

**35.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - තෆ්සීර් බිද්දිරායා තහනම් කරන ලද තෆ්සීර් වර්ගයකි.

B - තෆ්සීර් බිල් මඃසූර්, තෆ්සීර් බිල් මඃකූල් යනු දෙවර්ගයකි.

C - තෆ්සීර් ෆී ළිලාලිල් කුර්ආනය තෆ්සීර් බිල් මඃසූර්ට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

D - තෆ්සීර් බිල් අස්ර්, පමණක් අනුමැතිය ලද තෆ්සීරය ලෙස සැලකේ.

E - තෆ්සීර්, තඃවීල් යන දෙකම අල්-කුර්ආන් අර්ථ විවරණයන් වේ.

නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) A C (2) B D (3) B E (4) C D (5) D E

**36.** පහත පාලකයන් අතුරින් තජ්දීද් සේවයේ පුරෝගාමීව සිටි පුද්ගලයා වන්නේ,

(1) ඉමාම් අබ්දුල්ලා බින් සුබ්රි (රහ්) වේ. (2) ඉමාම් ගස්සාලි (රහ්) වේ.

(3) මව්ලානා ෂාහ් වලියුල්ලාහ් (රහ්) වේ. (4) ඉමාම් ෆුලෛල් බින් ඉයාල් (රහ්) වේ.

(5) කලීෆා උමර්බින් අබ්දුල් අසීස් (රහ්) වේ.

**37.** පහත කාණ්ඩවලින්, අරාබි අක්ෂර වර්ග පමණක් සඳහන් වන වරණය තෝරන්න.

(1) අර්රිකා,අල්-මුත්ආ, අල්-මුහක්කික් (2) නස්තලික්, තව්කි, සීනත්

(3) කුෆි, නස්හු, සුලුසි (4) අල්-මුහක්කින්, රයිහානි, මිස්මාර්

(5) රයිහානි, මිස්මාර්, හත්බාබූරි

**38.** අල්-කුර්ආනය, රිද්මයානුකූලව ලෙස පාරායනය කිරීම වෙනුවෙන් නබිතුමා විසින් ආශිංසනය කළ සහාබිගේ නම කුමක් ද?

(1) අබූ මූසා අල්-අෂ්අරි (රළි) (2) අබූ දර් අල්-ඉෆ්ෆාරි (රළි)

(3) අබූ සර්ද් අල්-කුද්රි (රළි) (4) අබූ අයියූබ් අල්-අන්සාරි (රළි)

(5) අබූ උබෛදා අල්-ජර්රාහ් (රළි)

**39.** 'ඉංග්‍රීසි අධ්‍යාපනයේ බලපෑමෙන් මුස්ලිම් සමාජයට උසස් සමාජයක් ලෙස වර්ධනය විය හැකිය' යන අදහස ඉදිරිපත් කළ විද්වතා

(1) සර් මුහම්මද් මාකාන් මාර්කර් වේ. (2) ආචාර්ය ටී.බී. ජායා වේ.

(3) එම්.සී. අබ්දුර් රහ්මාන් වේ. (4) එන්.ඩී.එච්. අබ්දුල් ගෆූර් වේ.

(5) අයි.එල්.එම්. අබ්දුල් අසීස් වේ.

**40.** රිෆාඉයියා තරීකාහි ආරම්භය සිදු වූ ප්‍රදේශය කුමක් ද?

(1) ජීලාන් (2) බුහාරා (3) බැග්ඩෑඩ් (4) ඩමස්කස් (5) බස්රා

**41.** කලීෆා උස්මාන් (රළි) තුමාට විරුද්ධව හා අලි (රළි) තුමාට සහයවන ආකාරයට අදහස් ප්‍රකාශ කර මුස්ලිම් සමාජයේ බෙදීමක් ඇති කළ පුද්ගලයා කවුද?

(1) ෆස්ල් බින් සහ්ල් (2) සෆ්වාන් බින් උමයියා

(3) උබෛ බින් සලූල් (4) අබ්දුල්ලා බින් සබා

(5) වාසිල් බින් අතා

**42.** නුසෛරිවරුන් ලෙස හඳුන්වන්නේ,

(1) ෂිආවරුන්ගෙන් එක් පාර්ශවයකි.

(2) මුඃතසිලාවරුන්ගේ එක් පාර්ශවයකි.

(3) කාරිජීවරුන්ගේ එක් පාර්ශවයකි.

(4) ස්පාඤ්ඤයේ ඇති කුඩා මුස්ලිම් රාජ්‍යයන්ගෙන් එකකි.

(5) ඉන්දියාවේ ඇති කුඩා මුස්ලිම් රාජ්‍යයන්ගෙන් එකකි.

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations

**43.** හුදෛබියා සම්මුතියෙන් පසුව රෝම රජුට නබිතුමාගේ ලියුම රැගෙන ගිය සහාබි වන්නේ,
(1) අබ්දුල්ලා බින් ජහ්ෂ් (රළි) ය. (2) සයිද් බින් සාබිත් (රළි) ය.
(3) හාරිස් බින් උමෛර් (රළි) ය. (4) අබූ හුසෛමා අල් -අන්සාරි (රළි) ය.
(5) සෑද් බින් උබාදා (රළි) ය.

**44.** සමාන අර්ථ සහිත වචන යුගලය ඇතුළත් වරණය තෝරන්න.
(1) අද්-දුන්යා වල්-ආකිරා
(2) අත්-තව්බා වල්-ඉස්තිඝ්ෆාර්
(3) අල්-මුත්කම් වල්-මුතෂාබිහ්
(4) අල්-මක්බූල් වල්-මර්දූද්
(5) අත් තෞහීද් වස්-සිර්ක්

**45.** ඖරංගසීබ් තුමා සමයේ මෝගල් පාලකයා විසින් සම්පාදනය කළ ඉස්ලාම් නීති ග්‍රන්ථය වන්නේ,
(1) ෆතාවා ඉබ්නු තෛමියා ය. (2) තොලුකෙ අඩවු ය.
(3) ෆත්හුද් දයියාන් ය. (4) ෆතාවා මුආසරා ය.
(5) ෆතාවා ආලම් කීරි ය.

● අංක **46** සිට **50** දක්වා එකිනෙක ප්‍රශ්නවල ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒ ප්‍රකාශ අතුරින් වඩාත් සුදුසු ප්‍රකාශ සබඳතාවය දෙන පිළිතුර පහත වගුවේ ඇත. (1), (2), (3), (4), (5) අංකවලින් තෝරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විග්‍රහ කෙරේ. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | පානත් සුහාද් යන ගීතය ගැයූ ගායක සුහෛල්, නබිතුමාගේ ප්‍රසංසාවට පාත්‍ර වූවෙකි. | ඉජ්මා කිරීමට එකකට වඩා වැඩි වූ මුජ්තහිද් තිබිය යුතුය යන්න එක් නිර්ණායකයකි. |
| **47.** | ඉමාම් ජඃෆර් බින් සාදික්ගේ පුත්‍රයා වූ ඉමාම් ඉස්මායිල් නමැත්තාව අනුගමනය කරන්නන් ඉස්මා ඉලියියාවරු වේ. | අහ්මර් විසින් ස්පාඤ්ඤයේ ඇති අල් හම්රා මාලිගාව නිර්මාණ කර ඇත. |
| **48.** | ඉඳගැනීමට ඉඩ දෙන පුටුව මෙන් ප්‍රතිවිරුද්ධ අදහස් ද පවති යන්න මුස්තෆා අහමද් සර්ක්කා සඳහන් කර ඇත. | කලීෆා මුආවියා (රළි) තුමා හදීස් එක්රැස් කිරීමේ කාර්යයට ඉමාම් සුහ්රි (රහ්) තුමාව යොදවා තිබුණේ ය. |
| **49.** | හොඳ කියා දී වැරදි වැළැක්වීමේ ක්‍රියාවේ දී පිරිමි හා ස්ත්‍රීන් සමාන අයිතින් ඇති අය වේ යන්න ඉස්ලාමීය මතය වේ. | තජ්දීද් කටයුතු සාමූහිකව හා තනි තනිව ද සිදුවිය හැකි ය. |
| **50.** | අලි (රළි) තුමා නජ්රාන් ප්‍රදේශයේ කිතුනුවන් හා ඇතිකර ගත් ගිවිසුම නජ්රාන් ගිවිසුම ලෙස හැඳින්වේ. | අයිෂා (රළි) හෆ්සා (රළි) දෙදෙනා පිළිවෙළින් කලීෆාවරුන් වන අබූබක්කර් (රළි) උමර් (රළි) යන අයගේ දූවරුන් වේ. |

* * *

Department of Examinations

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்
## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

### පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்

විෂයය අංකය / பாட இலக்கம்: **47** — විෂයය / பாடம்: **ඉස්ලාම් ශිෂ්ටාචාරය**

### ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 5 | 21. | 2 | 31. | 2 | 41. | 4 |
| 02. | 2 | 12. | 4 | 22. | 2 | 32. | 5 | 42. | 1 |
| 03. | 1 | 13. | 5 | 23. | 2 | 33. | All | 43. | 3 |
| 04. | 1 | 14. | 2 | 24. | 5 | 34. | 1,2,3 | 44. | 2 |
| 05. | 3 | 15. | 3 | 25. | 5 | 35. | 3 | 45. | 5 |
| 06. | 3 | 16. | 4 | 26. | 2 | 36. | 5 | 46. | 1 |
| 07. | 3 | 17. | 1 | 27. | 3 | 37. | 3 | 47. | 1 |
| 08. | 5 | 18. | 2 | 28. | 1 | 38. | 1 | 48. | 2 |
| 09. | 3 | 19. | 5 | 29. | All | 39. | 2 | 49. | 1 |
| 10. | 2 | 20. | 2 | 30. | 1 | 40. | 5 | 50. | 4 |

Department of Examinations

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

**ඉස්ලාම් ශිෂ්ටාචාරය**
**පැරණි නිර්දේශය**

1. (i) මදීනා හිජ්රතය සැලසුම් කළ එකක්ය යන්නට සාක්ෂි **දෙකක්** ඉදිරිපත් කරන්න.

- අබුබකර් (රළි) සමඟ නබිතුමාණන්ගේ සංවාදය.
- ගමනාන්තයට සංවිධාන.
- සහාබාවරුන් බොහෝ දෙනෙක් නබිතුමාට කලින්ම මදීනාවට පැමිණෙන්නට සහය දීම.
- අකබා ගිවිසුම සහ මුස්අබ් ඉබ්නු උමෙයිර් (රළි) මදීනාවට යන්න සැලසුම් කිරීම.
- අල්ලාහ්ගේ අනුමැතිය තෙක් බලා සිටීම.

**(ලකුණු 04)**

(ii) උස්මාන් (රළි) තුමා කලීෆා ලෙස තෝරා පත්කළ ක්‍රමය විස්තර කරන්න.

- උමර් (රළි) තුමානන් තමන්ට පසුව සුදුසු කෙනෙක් කලීෆා වශයෙන් තෝරා පත් කිරීමේ අරමුණින් සහාබිවරුන් හය දෙනෙක් අඩංගු පිරිසක් නියමකර ඒ හය දෙනාගෙන් කෙනෙක් තෝරා ගන්නැයි යෝජනා කළේය.

**(ලකුණු 04)**

(iii) කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) තුමාගේ පාලනයේ විශේෂාංගයන් **හතරක්** විස්තර කරන්න.

- ශූරා පදනම්කොට ගොඩනඟපු පාලනය.
- අල් කුරානය සහ අස්සුන්නා මග ප්‍රථම ස්ථානය ලැබීම.
- සමාජයේ අනන්‍යතාවය ඉහළ යාම සහ ආර්ථික සංවර්ධනය වීම.
- බෛතුල් මාලය පොදු භාණ්ඩාගාරයක් සේ පාලනය කිරීම.
- සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම.
- සුදුස්සන් සහ ස්වයංපාලන ආරක්ෂා කරන අය පදවිවලට තෝරා පත් කිරීම.
- ආගමානුකූල කලාව ආරක්ෂා වීමටත් ඉදිරිපත් කිරීමටත් වගබලා ගැනීම.

**(ලකුණු 04)**

(iv) රෝමානු හා පර්සියානු අධිරාජ්‍යයන් මුස්ලිම්වරුන් විසින් ජයග්‍රහණය කිරීමට හේතු වූ සාධක **හතරක්** පරීක්ෂා කරන්න.

- රෝමානු පර්සියානු ප්‍රදේශවල දැක ගැනීමට ලැබුණු අපැහැදිලි ස්ථාවරය සහ මතභේද.
- මුස්ලිම් බලඇණියේ නායකත්වය සහ හමුදාවේ විධිමත් සටන් ක්‍රමය.
- රෝමානු පර්සියානු ප්‍රදේශවල වධහිංසාවට ලක්වූ ජනතාව මුස්ලිම්වරුන්ගේ පැමිණීම බලා සිටීම.
- අල්ලාහ්ගේ උපකාරය සහ ආධ්‍යාත්මික බලය (ජයග්‍රහණය සහ පරාජය දෙකම එක සේ සැලකීම).
- ජයග්‍රහනය පිළිබඳ පෙර දැනුම් දීම සහ ජයග්‍රහණය ලැබෙනවා යැයි විශ්වාසය උඩ මුස්ලිම්වරු සටන් කිරීම. **(ලකුණු 04)**

Department of Examinations

(v) ඉස්ලාම් ශිෂ්ටාචාරය අනෙක් ශිෂ්ටාචාරයන්ගෙන් වෙනස්වන කරුණු **හතරක්** විස්තර කරන්න.

- ඒක දේවවාදී සංකල්පය.
- දේවාරුඪත්වය සහිත. (රබ්බානියියත්)
- සම්පූර්ණත්වයෙන් යුත් ය. (ෂුමූලියියත්)
- ජාත්‍යන්තර භාවයෙන් යුක්තය. (ආලමියියත්)
- පරිහරණයට සුදුසු යි. (වාකිඉයියත්)
- පොදු ගුණාත්මයෙන් යුතු ය. (උමූ මියියත්)
- සමානාත්මයෙන් යුත් ය. (ආධ්‍යාත්මික, ලෞකික)

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

Department of Examinations

2. (i) නබි (සල්) තුමා තම 'දඃවා' සේවයේ දී මුහුණ දුන් අභියෝග **හතරක්** සඳහන් කරන්න.

- මානසික තර්ජන
- ශාරීරික තර්ජන
- වෙන්දේසි කරණය (බලය සහ මුදල්).
- සමූහ සමාජයෙන් ප්‍රතික්ෂේප කිරීම.
- ඉස්ලාමය පිළිගත් අය කෙරෙහි විරුද්ධවාදීන් ඇති කළ කෝලාහල.

(ලකුණු 04)

(ii) අකබා සම්මුතියන්හි අන්තර්ගත කොන්දේසි **හතරක්** සඳහන් කරන්න.

- අල්ලාට විතරක් නැමදුම් කිරීම, ඔහුට කිසි දෙයක් සමාන නොකිරීම.
- සොරකම දුරාචාරයෙන් වැළකී සිටීම.
- කුඩා දරුවන් ඝාතනය නොකිරීම.
- පණටත් වඩා ඉහළින් නබි තුමාව ආරක්ෂා කිරීම.
- පොහොසත් සහ දුප්පත් අවස්ථාවන්හිදී ද ධර්මයට වියදම් කිරීම.
- මෙය තහවුරු කරන්නට අල්කුර්ආනයේ සූරා මුම්තහිනාව උපුටා පෙන්වීම.

(ලකුණු 04)

(iii) ගෝත්‍රික බෙදීම් කිලාෆතයේ ඇති කළ බලපෑම් **දෙකක්** පරීක්ෂා කරන්න.

- මුස්ලිම් උම්මත් බැලහීනළට පත්වීම සහ ඔවුන් අතර සාමූහිකත්වය බිඳවැටීම.
- ඔවුන් අතර ගෝත්‍රික පාලන ක්‍රමය බිහිවීම.
- මුස්ලිම් අධිරාජ්‍යවාදී සංකල්පය බිඳ වැටීම.

- මුස්ලිම් අතර අභ්‍යන්තර ගැටළු මතභේද ඇති වී ජීවිත හානි වත්කම් අහිමි වීම.
- පොදු හිතවාදී රජයක් බිහි වීමට ඉඩ නොලැබීම.

**(ලකුණු 04)**

(iv) උමයියා පාලනය බිඳවැටීමට හේතු වූ කරුණු **හතරක්** විස්තර කරන්න.

- ඉස්ලාමීය මගපෙන්වීම ප්‍රතික්ෂේප කිරීම.
- උමෙයියා පාලකවරුන්ගේ සුඛෝපභෝගී ජීවන රටාව.
- ගෝත්‍රික චින්තනය අධිතක්සේරු කර එකමුතුව බිඳවැටීම.
- පසුකාලීන කලීෆාවරුන්ගේ අසමගිය.
- බෛතුල්මාල් අයුතු ලෙස භාවිතා කිරීම.
- අසිවරුන්ගේ විප්ලවය සහ සැලසුම් සහගත ප්‍රචාරය.
- උමෛයියාවරුන් පිළිබඳ ජනතාවගේ අකමැත්ත සහ ජනතාව බලාපොරොත්තු වූ වෙනස.

**(ලකුණු 04)**

(v) අබ්බාසි කිලාෆතය ස්ථිර කිරීමට කලීෆා මන්සූර්ගේ දායකත්වය විස්තර කරන්න.

- අබ්බාසි පාලනයට විරුද්ධ විය හැකියැයි පිරිස නැතිකර දැමීම ( අබුමුස්ලිම් අල් කුරාසානි අබ්දුල්ලා බින් අලී).
- පාලන තන්ත්‍රයට ආරක්ෂාවයි හිතා අගනුවර බග්දාද් වලට මාරු කිරීම.
- පරිපාලන වෙනස්කම්.
- සුදුසුකමට සහ දක්ෂතාවයට ඉඩදී පත්වීම් ලබා දීම.
- හමුදා බලඇණියේ ස්ථාවරත්වය සකස් කිරීම.
- මෙවැනි කාරණාවල් උඩ අබ්බාසිය කිලාෆයේ පිළිගත් නිර්මාතෘවරයා යනුවෙන් පිළිගැනීම.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**

3. (i) නබි තුමාගේ සමයේ හදීස් ආරක්ෂා කළ විධි ක්‍රම **හතරක්** සඳහන් කරන්න.

- කටපාඩම් කිරීමෙන්.
- ලියා තැබීමෙන්/ලිවීමෙන්.
- ක්‍රියාවලියෙන්.
- ඉගෙන ගැනීම සහ උගැන්වීම.
- හිත පරික්ෂාකිරීමෙන්.

**(ලකුණු 04)**

Department of Examinations

(ii) "ඉජ්තිහාද් නීති සම්පාදනය කිරීමට දායකවන සාධකයක් වේ." යන්නට කුර්ආන් සහ හදීස් මූලාශ්‍ර **එක** බැගින් සඳහන් කරන්න.

- අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් ඔබට උගන්වපු ආකාරයේ ජනයා හමුවේ යුක්තිය ඉටුකිරීම සඳහා සත්‍ය ඇතුළත් ධර්මයේ අපිමය ඔබ වෙත ස්ථිර වශයෙන් ම පහළ කළෙමු.
- තවද නිහඬතාවේ හෝ බිය ඇති විය හැකි යම්කිසි ක්‍රියාවක් නඩුකාරවරයෙක් තමන්ගේ පර්යේෂණය තුළින් භාවිතා කර ගන්නා ලද විසඳුම් හදීස්.
- බනු කුරෙයිලා සිද්ධිය-මුආද් බින් ජබල් සිද්ධිය.
- අල් කුරාණ වැනි අරාබියෙන් සඳහන් කර ඇත.

**(ලකුණු 04)**

(iii) ඉජ්මා අක්සරියියා පිළිගන්නා ඉමාම්වරු ඉදිරිපත් කරන මූලාශ්‍ර **දෙකක්** විස්තර කරන්න.

- ඉජ්මා අක්සරිය්යාව පිළිගැනීමේදී ඉමාම්වරුන් අතර මතභේද පැවැත්වීම.
- ඉමාම් ඉබ්නු ජරිර් අත්තබරි, අබුබක්කර් රාසි, අහ්මද් ඉබ්නු හන්බල් යන අය මෙය පිළිගනු ඇත.
- මාගේ උම්මත්වරුන් වැරදි ක්‍රියාවලියේ එකමුතු වෙන්නේ නැත යන හදීසය.
- ඔබලා මතභේදාත්මක දෙයක් දැනගන්න ලැබුවානම් ජනතාව වැඩි දෙනෙක් ඉන්න පැත්ත තෝරා ගන්න (හදීස්).
- තනියෙන් යෑම පිළිබඳව අවවාද කරමි (හදීස්).
- අබුබකර් (රලි) තුමා කලීෆා වශයෙන් පත්වීම් ලැබීමේ ක්‍රමය.
- යම්කිසි පිරිසකගේ මතභේදය සැලකී ක්‍රියා කළහොත් ඉජ්මා යනු කිසිසේත් පිළිගනු නොමැත (තර්කානුකූල අදහස්).

**(ලකුණු 04)**

(iv) ශ්‍රී ලංකාවේ මුල් කාලීන මුස්ලිම් ජනාවාස වෙරළාසන්න ප්‍රදේශවල බිහිවීමට හේතු වූ කරුණු **හතරක්** විස්තර කරන්න.

- ස්වභාවික වරාය පහසුකම් තිබීම.
- මෝසම් කාලයෙහි භාණ්ඩ ගබඩා කිරීමේ පහසුකම් තිබීම.
- මුහුදුකොල්ලය සහ සොරුන්ගේ ගැවසීම අවධානයට ලක් කිරීම අවශ්‍ය ඇතිවීම.
- ආනයනය කරන භාණ්ඩය වෙළෙඳ පොළට බෙදාහැරීම සහ ආනයනය භාණ්ඩය තැන්පත් කිරීමට මුහුදු වෙරළ අවස්ථාව ලබා දීම.
- මුහුදු වෙරළේ නවාතැන් ගත් මුස්ලිම් වෙළඳුන් එහි ජීවත් වුනු ලංකාවේ සිංහල කාන්තාවන් විවාහ කරගැනීම.

**(ලකුණු 04)**

Department of Examinations

(v) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ පුනරුදයේ දී ආචාර්ය T.B. ජයා තුමාගේ සේවය අගය කරන්න.

- ජායාතුමාණන් කෙරෙහි හැඳින්වීම.
- කොළඹ සහිරා විදුහලේ විදුහල්පති වශයෙන් කටයුතු කිරීම (1920).
- එම විදුහලේ වෙනස්කම් රාශියක් ඇති කිරීම.
- එම විදුහලේ ශාඛාවන් ලංකාව පුරා ඇති කිරීම.
- ඩොනමූර් වාර්තාව කෙරෙහි ඇපැල යැවීම.
- සෙනට් සභාවේ සාමාජිකයා ලෙස ක්‍රියා කිරීම.
- පාර්ලිමේන්තුවේ සාමාජිකයා සහ මැති ඇමති තනතුරු දැරීම.
- රටට නිදහස ලබා ගැනීමේ සටනට ලංකාවේ අනෙකුත් සාමාජිකයන් සමඟ එකතුවීම/සටන් කිරීම.
- ලංකාවේ හාජිවරුන්ගේ යහපත උදෙසා ජිද්දාවේ සිලෝන් හවුසය ස්ථාපිත කිරීම.
- නැෂනල් කොන්ග්‍රසයේ උප සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම.
- පාකිස්තානයේ ලංකාවේ තානාපති වශයෙන් කටයුතු කිරීම.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**

Department of Examinations

**4.** (i) නබි තුමාගේ සමයේ අල්-කුර්ආනය ආරක්ෂා කිරීමට ගත් උත්සාහයන් ගැන පරීක්ෂා කරන්න.

- අල් කුර්ආනය ආරක්ෂා කිරීමේ පළවෙනි යුගය නබිතුමාගේ යුගයයි.
- අල් කුර්ආනයේ වැකි පාරායනය කිරීම.
- කියවීම.
- කොටස් වශයෙන් පහල වීම.
- ලියා තැබීම (කුත්තාබුල්වහි).
- ඉගෙන ගැනීම සහ උගැන්වීම.
- ක්‍රියා කිරීම (සලාතය තුළ කියවීම පිළිපැදීම).

  සෑම උපවාස මාසයකදීම එතෙක් පහළ වූ වැකි ප්‍රමාණය නැවත නැවත පාඩම් කිරීම.
- නබිතුමාගේ අවසාන උපවාස මාසයේ දී කුර්ආනය ජිබ් රඊල් අලෛ තුමා විසින් කියවා සම්පූර්ණ කිරීම. (සෛද් බින් සාබිත් (රළි ) )තුමාගේ සහභාගීත්වය.

**(ලකුණු 10)**

(ii) 'ඉස්ලාම් උම්මතය' ගොඩනැගීමට අල්-කුර්ආනයේ භූමිකාව පැහැදිලි කරන්න.

- මිනිසා, පවුල, සමාජය පිළිබඳ ඉස්ලාම් අදහස පැහැදිලි කිරීම.
- ආධ්‍යාත්මික චින්තනයෙන් යුත් පවුල් විවාහය පිළිබඳ විස්තර.
- අල් කුර්ආනයේ පොදු භාවය, මගපෙන්වීම, සමාජ අනුකූලව.
- එය ඉදිරිපත් කරන්නට හැකියාව.(යා අය්යුහල්ලදින ආමනූ)
- විනය ගරුක, කළමනාකරණය, නීතිය ඇතුළත් පදනම් වූ නීතීන් සියලු දේ අල් කුර්ආනයේ. අන්තර්ගත වීම.
- සියලු දෙනාගේම වගකීම් සීමා කර පෙන්වා දීම.
- ඉස්ලාමය සමාජය ප්‍රතිපත්ති සහිත සමාජයක් ලෙස පෙනීම.
- නායකත්වයට අවනත වන ලෙස ස්ථිරවම පැවසීම.
- හලාල් සහ හරාම් ඒ ආකාරයෙන්ම පිළිපැදීම.
- තක්වා සමග ජීවිත ගත කිරීම.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**5.** (i) විශ්වය හා මානවයා ගැන ඉස්ලාමික දෘෂ්ටිකෝණය කෙටියෙන් විස්තර කරන්න.

<u>**විශ්වය**</u>

- විශ්වයේ බිහිවීම. (අල් හාලික්, අල් බාරි)
- විශ්වය අල්ලාහ්ට අයිතිය. ඔහු ඒකේ අයිතිකාරයායි. (මාලිකුල් මුල්ක්)
- විශ්වය අල්ලාගේ අණ පරිදි ක්‍රියා කිරීම.
- විශ්වය ඉලක්කයක් පදනම්කොට මැවීම.
- ප්‍රපංචය සහ එහි සියලු දේ මනුෂ්‍යයා වෙනුවෙන් මැවුම් කරන ලදී.
- ප්‍රපංචය නිශ්චිතයක් නොව අවිනිශ්චිතයි එය විනාශ විය හැකියි.

<u>**මිනිසා**</u>

- මනුෂ්‍ය ජාතිය බිහිවීම අල්ලා මැවුම්කරුවා ය.
- පළවෙනි මනුෂ්‍යයා බිහිකිරීම මැටි-රූහ්.
- ශරීරය, අධ්‍යාපනය, ආත්මය තිබෙන වග.
- අල්ලාහ් විසින් මග පෙන්වන ලදී.
- මිනිසා ගරුත්වයට පාත්‍රයි. (අල්ලාගේ නියෝජිත කලීෆතුල්ලාහ්)
- මිනිසාගේ සමානභාවය - තක්වාවෙන් මැනීම.
- වගකීම් පවරා ගැනීම - පරලොවදී විමසුමට ලක්වනුය.

Department of Examinations

- සියලුම ආත්මය මරණයේ රුචිකත්වයට පාත්‍ර වෙයි.
- හොඳ ක්‍රියාකාරකම්වලට පින් ද වැරදි ක්‍රියාකාරකම් වලට දඬුවමද අල්ලාගේ කැමැත්ත පරිදි ලැබේ.
- ඉබාදත්, ඉමාරත්, කිලාෆත් වගකීම් පැවරුම්කරන ලදී.

**(ලකුණු 10)**

(ii) ඉස්ලාමීය සමාජය ජාහිලිය්‍යා සමාජයෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

| මුස්ලිම් සමාජය | ජාහිලියියා සමාජය |
|---|---|
| • ප්‍රතිපත්තිගරුක සමාජයක් | • ගෝත්‍රික හැඟීම් මත පදනම් වීම |
| • තක්වාවට මුල්තැන | • හැඟීම් වලට මුල්තැන |
| • පොදු නායකත්වයට ගරු කරයි | • ගෝත්‍රික නායකත්වයට ගරුකයි |
| • හලාල් හරාම් සහ නීතිය හා බැඳේ | • ආත්මාර්ථකාමී සහ උදුරා ගැනීමේ හැඟීම් වැඩියෙන් දැනීම |
| • අල්ලාගේ සහ දූතයන්ගේ ආදර්ශය වැඩියෙන් දැකීම | • මිනිසාගේ කැමැත්ත අකමැත්ත ට ඉඩ දීම |
| • ස්ත්‍රී පක්ෂයගේ සමාජ ගරුත්වය, වත්කම් අයිතිය තහවුරු වීම. | • ස්ත්‍රීන් දෙවැනි පන්තිය සේ සැලකීම |
| • වැරදි දේ පිළිබඳ දැඩි අවදානම් වීම | • වැරදි පිළිබඳ ගණන් නොගැනීම |
| • හරි ආකාරයෙන් යුත් විවාහ ක්‍රමය සහ පවුල් පාලනය තිබීම | • ක්‍රමයක් නැති විවාහ ජීවිත සහ පවුල් ජීවිතය |
| • විනය, නැමදුම සහ පින් ක්‍රියා වලට නිසි තැන ගැනීම | • විනය පිං ක්‍රියාවල් ස්ථිර තැනක් නොලැබීම |

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

Department of Examinations

**6.** (i) සමාජ සහජීවනය පිණිස ඉස්ලාම් මගපෙන්වීම් සාධක සහිතව පැහැදිලි කරන්න.

- මනුෂ්‍ය සමානතාවය ස්ථිර කර සිටීම.
- මනුෂ්‍යත්වයම, සහෝදරත්වය, ස්ථාපිත කිරීම.
- මනුෂ්‍යයන් ජාතීන්, කුල වශයෙන් වෙන්කර සිටීම ස්වභාවිකයි සහ හඳුනා ගැනීමට අවස්ථාවක් ද වේ යැයි මතය.
- ඉවසීම සහ එකඟතාවය.
- පුණ්‍ය කටයුතු වල එකිනෙකාට උදව් උපකාර කර ගැනීම ඒ වගේම වැරදි ක්‍රියාවල අනෙකාගෙන් වෙන්වී සිටීම.
- ප්‍රතිපත්ති නිදහස.
- ප්‍රතිඋපකාර නොබලා එකිනෙකාට උදව් කිරීම සහ එයට උනන්දු කරවීම.
- නීතිය ඉදිරියේ සියළු දෙනා සමානයි.
- දිය නොවී මිශ්‍ර වී ගත කිරීම.

- පරස්පර උදව් සහ එකමුතු ක්‍රියාවල්.
- එකට වැඩ කිරීමේ/ ක්‍රියා කිරීමේ උනන්දු කරවීම යනාදිය.

**(ලකුණු 10)**

(ii) ශ්‍රී ලංකා මුස්ලිම්වරු මහනුවර රාජධානියට ලබාදුන් පරිපාලන සේවාවන් විස්තර කරන්න.

- බැද්ද යනු පරිපාලන ක්ෂේත්‍රයේ මුස්ලිම්වරුන්ගේ සහභාගිත්වයයි.
- තානාපතිවරුන් වශයෙන් කටයුතු කිරීම.
- වෛද්‍යවරු වශයෙන් කටයුතු කිරීම. (වෙදරාළ)
- කාරන කාරියලාගෙ.(දළදා මාළිගාවේ ප්‍රධාන නියෝජිත)
- හේවපන්න නොහොත් මුරපොළ භාරකාරීත්වය.
- දළදා මාලිගාවේ රාජධානියේ වගකීම. (Royal Kitchen/ Royal Bath)
- ග්‍රාම නායකත්වය මුහන්දිරම් යන තනතුරු.
- ශ්‍රී වික්‍රම රාජසිංහ යුගයේ විනිශ්චකාර පත්වීම.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**7.** (i) වෛද්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට අලි ඉබ්නු සීනාගේ දායකත්වය විස්තර කරන්න.

- අවිසන්නා යන නාමයෙන් යුරෝපානුවන් විසින් හඳුන්වාදීම.
- පොඩි කාලයේදීම ඉතා දක්ෂ වෛද්‍යවරයෙක් වශයෙන් පිළිගැනීම/ ප්‍රශංසාවට ලක් වීම.
- විශේෂ නම් කිහිපයක් තිබේ.(සයිකුර් රර්ස්, දෙවෙනි ඇරිස්ටෝටල්)
- වෛද්‍ය ග්‍රන්ථ - කානුන් පිත්තිබ්බ්, කිතාබ් අශ්ශිෆා
- බහු අංශවල නිපුණතාවය ලබා සිටීම. (ග්‍රන්ථ 99/ වෛද්‍ය ග්‍රන්ථ 17ක්)
- සාමාන්‍ය වෛද්‍යවරයා ලෙස සහ ශල්‍ය සැත්කම් වරයෙක්, අක්ෂි, විශේෂ නාරි වේදියෙක් වශයෙන් ද කැපී පෙනුණි.
- බුහාරාවේ පාලකවරයා දෙවැනි නුහ්ව සුවපත් කර ප්‍රශංසාවට ලක් වීම.
- ඔහුගේ ග්‍රන්ථ කිහිපයක් විශ්ව විද්‍යාල වල පෙළපොත් වශයෙන් පිළිගැනීම.

නව සොයාගැනීම්

- කෑම ජීර්ණ, ඇස්පෙනීම, බෝ වන රෝග.
- නවීන වෛද්‍ය විද්‍යාවේ පියා යනුවෙන් සැලකේ.

**(ලකුණු 10)**

Department of Examinations

(ii) ඉතිහාස ක්ෂේත්‍රයේ මුස්ලිම්වරු උද්‍යෝගීමත්වීමට හේතු වූ කරුණු සඳහන් කොට එහි වර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය අගය කරන්න.

<u>උනන්දුව</u>

- අල් කුර්ආනය ඉතිහාස, සිදුවීම් පිළිබඳ ප්‍රකාශ කිරීම.
- නබිතුමාණන් ඉතිහාසයේ සිදුවීම් පිළිබඳව කියා දීම.
- නබිතුමාණන්ගේ ජීවිත ඉතිහාසය දැනගැනීමේ ප්‍රමුඛතාව.
- දැනුම ලබාගැනීමේ ඉතිහාසයට තිබෙන ප්‍රමුඛතාවය.
- හදීස් වල පිරිසිදුකම ආරක්ෂා කිරීමේදී තනි පුද්ගලයාගේ ඉතිහාසය සොයා පර්යේෂණ කිරීම. රාජ්‍ය විස්තීරණ කිරීමෙහි ප්‍රාදේශීය ඉතිහාසය දැන ගැනීමේ උනන්දුව දැක්වීම.
- තමන්ගේ පරම්පරාව දැන ගැනීමේ උනන්දුව වැඩි වීම.

<u>දායකත්වය</u>

- ඉතිහාස ක්ෂේත්‍රයේ ග්‍රන්ථ නිකුත්වීම. (සීරා, මගාසි, ප්‍රාදේශීය ඉතිහාසය, ලෝක ඉතිහාසය, බහු වංශ ඉතිහාසය යනාදී උදාහරණ පෙන්වා ලිවීම)
- කාලය වගේම ඒ පිළිබඳ පණිවුඩ යනාදී දේවල්වල යථා තත්ත්වය ස්ථිර කිරීම.
- කාරන කාර්යයන් සමග සම්බන්ධ අනික පක්ෂපාතී නොවී විද්‍යානුකූලව ඉතිහාසය ඉදිරිපත් කිරීම නාම අනුක්‍රම ආරක්ෂා කර ගැනීම.
- ඉතිහාසය දර්ශනානුකූලව ඇති කල ඒ අනුව ඉතිහාසයේ ක්ෂේත්‍රය වර්ධනය කිරීම.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**8.** (i) ෂිආ වරුන්ගේ 'ඉස්මත්' 'ඉමාමත්' සංකල්ප සවිස්තරාත්මකව පරීක්ෂා කරන්න.

❖ <u>ඉමාමත්</u>

- කිලාෆත්ට වඩා ඉමාමත්වයට විශේෂ තැනක් දීම.
- ඉමාමය පිළිගැනීම විශ්වාසයෙන් කොටසක් සේ සැලකීම.
- ඉමාම්වරු අලි (රලි) තුමාගේ පරම්පරාවෙන් පැමිණිය යුතුයි.
- නබිවරුන් වගේම ඉමාම්වරු මවුසූම් වශයෙන් පිළිගැනීම.
- ඉමාම් වරුන්ට වහි පහළ වනු යැයි පිළිගැනීම.
- ඉමාම්වරු 12ක් පිළිගැනීම සහ එහි දොළොස්වෙනි ඉමාම් වරයා සැඟවී සිටින බව ද නැවත පැමිණෙනවායි විශ්වාස කිරීම.

Department of Examinations

❖ ඉස්මත්

- ඉමාම්වරුන් පවෙන් මිදී සිටින අයද නොරහස් පව් නොකරන යන අය වශයෙන් පිළිගැනීම

**(ලකුණු 10)**

(ii) මුඃතසිලා, අෂ්-අරියියා චින්තන කණ්ඩායම් අතර දක්නට තිබුණු මතවාදයන් විස්තර කරන්න.

| මුහ්තසිලා | අශ්අරිය්යා |
|---|---|
| තාන් සිෆාත් යන දෙකම බෙදන්නට නොහැකිය. | තාන් සිෆාත් යන දෙකම බෙදන්නට පුළුවන් |
| අල්ලාහ් ව මෙලොව සහ පරලොව දී දක්නට බැරිය | අල්ලාහ් ව හොඳ බැතිමතුන්ට පරලොව දී දැකගත හැකිය |
| අල්-කුර්ආනය මැවුම් කළ දෙයකි | එය අල්ලාහ්ගේ දේශණයකි |
| මිනිසා සම්පූර්ණ නිදහසයෙන් යුත්ය | මිනිසා සීමිත නිදහසයෙන් යුත්ය |
| මහා පාපයන්වල නිරතවන අය (මුඃමින් සහ තාෆිර් ස්ථාවරයට අතරතුර කෙනෙක් ය) | ඔහු පව්කාරයෙකි දෙවියන්ගේ කැමැත්ත අනුව තීරණය වේ |
| ශෆාඅත් හොඳ බැතිමතුන්ට පමණි | මුස්ලිම්වරු සියලු දෙනාටම ය |
| හොඳ දේ අණ කර වැරදි දේට විරුද්ධ වීම ෆර්ලු අයින්ය. | ෆර්ලු කිෆායාය |
| මිනිවලේදී ක්‍රියාවන් පිළිබඳ විමසුම් නැත. | මිනිවලේදී ක්‍රියාවන් පිළිබඳ විමසුම් ඇත. |

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

Department of Examinations